# ඉන්දියාව ජනාධිපතිට දුන් පණිවුඩය

ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මහතා ඉන්දියාවට ගිය විට එතුමා පිළිගැනීමට පැමිණ සිටියේ එරට පංචයාති ක්‍රමය පිළිබඳ ඇමතිවරයා හා නියෝජ්‍ය ඇමතිවරයකු පමණ ය. එංගලන්තයේ හෝ ඇමරිකාවේ නොව ඉතා කුඩා රාජ්‍යයක රාජ්‍ය නායකයකු ඉන්දියාවට පැමිණිය ද, ඒ අයට රාජපක්‍ෂ මහතාට දුන් ගෞරවයට වඩා විශාල ගෞරවයක් දීමට ඉන්දියාව වග බලාගනියි. රාජපක්‍ෂ මහතාට සැලකූ ආකාරය ඔස්සේ ඉන්දියාව ලංකාවට දුන් පණිවුඩය ඉතා වැදගත් ය. ඉන්දියාව කියා සිටින්නේ ලංකාව ඔවුන් කියන ආකාරයට ක්‍රියා කළ යුතු බව ය. එසේ නොකරන්නේ නම් ලංකාවට විඳින්නට සිදුවන දේ ගැන ඉන්දියාව සංඥා මාර්ගයෙන් දැනුම් දෙයි. සංකේත හා සංඥා මගින් දුන් පණිවුඩ සෙසු ලෝකයාට ද දැනගැනීම සඳහා ය. ඒ හැරෙන්නට ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මහතා ඉන්දිය අගමැති මනමෝහන් සිං හා වෙනත් නායකයන් මුණගැසුනු අවස්ථාවල ඔවුන් ඒ මහතාට සෘජුව ම යම් යම් දෑ ප්‍රකාශකරන්නට ඇත. ඔවුන් කීවේ කුමක් දැයි රාජපක්‍ෂ මහතාගේ සමීප ම හිතවතුන් හැරෙන්නට අනෙක් අයට දැනගන්නට නොලැබෙනු ඇත. ඒ කණගාටුවට කරුණකි. ඊනියා රාජතාන්ත්‍රික සම්ප්‍රදායන් පසෙක තබා රාජපක්‍ෂ මහතා තමාට ඉන්දීය නායකයන් කළ බලපෑම් රට හමුවේ තබන්නේ නම් මැනවි.

ඉන්දියාව රාජපක්‍ෂ මහතාට කියන්නට ඇත්තේ කුමක් දැයි අපට අනුමානකිරීමට සිදුවන්නේ ඒ කරුණු අපට හෙළිදරවු නොකෙරෙන බැවිනි. රාජපක්‍ෂ මහතා ඉන්දියාව බලා පිටත්වීමට දින කිහිපයකට පෙර ඉන්දීය විදේශ ලේකම්වරයා මෙරටට පැමිණියේ ය. ඔහු පැමිණියේ රාජපක්‍ෂ මහතාගේ සුවදුක් බැලීමට නොවන බව පැහැදිලි ය. ඉන්දීය විදේශ ලේකම්වරයා ලංකාවට ගෙන ආ පණිවුඩය අන් කිසිවක් ගැන නොව උතුරු හා නැගෙනහිර පළාත් එක්කිරීම හා සම්බන්ධව ය. ඉන්දියාවට අවශ්‍ය ඒ පළාත් දෙක එක්කිරීම ය. එසේ එක්කර බලය බෙදීම ය. ඉන්දියාවේ දී ද මනමෝහන් සිං මහතා හා අනෙක් ඉන්දීය නායකයන් ප්‍රධාන වශයෙන් ම බලපෑම්කරන්නට ඇත්තේ උතුරු හා නැගෙනහිර පළාත් එක්කර බලය බෙදීම හා සම්බන්ධයෙන් ය.

පසුගිය දා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවකින් උතුරු හා නැගෙනහිර පළාත් එක්කිරීම නීත්‍යානුකූල නොවන බව ප්‍රකාශ කෙරිණි. උතුරු හා නැගෙනහිර පළාත් වෙන්කළ යුතු යැයි එදා සිට ම කියන අපට ඒ තීන්දුව සතුටට කරුණකි. එහෙත් අප අමතක නොකළ යුතු කරුණ නම් ඒ අධිකරණ තීන්දුවක් පමණක් බව ය. අධිකරණය තීන්දු දෙන්නේ පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා අණ පණත්වලට එකඟව ය. එනම් ව්‍යවස්ථාව හා අණ පණත් අධිකරණය විසින් අර්ථ නිරූපණය කෙරෙන ආකාරයට ය. ඒ තීන්දු වලංගුවන්නේ පවත්නා නීතිය යටතේ ය. එහෙත් ව්‍යවස්ථාදායකයට අණ පණත් පමණක් නොව රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද වෙනස්කළ හැකි ය. අවශ්‍ය නම් උතුරු හා නැගෙනහිර පළාත් එක්කර බලය බෙදෙන අයුරින් ව්‍යවස්ථාව සම්පාදනය කරගත හැකි ය. එහෙත් එහි ද ප්‍රශ්නයක් වෙයි. විප්ලවයක් වැන්නක් නො සිදුවූ අවස්ථාවක දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස්කළ හැක්කේ, එනම් සංශෝධනය කළ හැක්කේ හෝ වෙනත් ම ව්‍යවස්ථාවක් සම්මත කරගත හැක්කේ හෝ පවත්නා ව්‍යවස්ථාවට එකඟව ය. අද ඉන්දියාවට හා ඉන්දියාව සමග එක්ව ක්‍රියාකරන එක්සත් රාජධානියට හෙවත් බ්‍රිතාන්‍යයට හෙවත් එංගලන්තයට ප්‍රශ්නයක් වී ඇත්තේ ද තමන්ට අවශ්‍ය දේ පවත්නා ව්‍යවස්ථාවට එකඟ ව කරගන්නේ කෙසේ ද යන්න ය.

යම් හෙයකින් උතුරු හා නැගෙනහිර පළාත් එක්කරන අයුරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කර බලය බෙදීමට එ ජා පක්‍ෂයේ සහාය ඇතිව ආණ්ඩුව ක්‍රියාකළහොත් එවැනි අවස්ථාවක දී අධිකරණයට කළහැකි දෙයක් නැතිවනු ඇත. අධිකරණය ඇත්තේ ව්‍යවස්ථාව හා අණ පණත් අර්ථදැක්වීමට මිස අණපණත් පැනවීමට නො වෙයි. අප මේ කරුණ වටහා නොගෙන අධිකරණ තීන්දුවෙන් පමණක් ප්‍රීතිප්‍රමෝදයට පත්ව කටයුතු කළහොත් අප නොදැනීම උතුරු හා නැගෙනහිර පළාත් එක්කර බලය බෙදෙනු ඇත. ඉන්දියාව මෙතරම් තදින් උතුරු හා නැගෙනහිර පළාත් එක්කර බලය බෙදන ලෙස ඉල්ලන්නේ සිංහලයන්ට ඒ පළාත් දෙක අහිමිකිරීමට ය. එමගින් සිංහලයන්ට පාඩමක් ඉගැන්වීමට ය. එහි දී බ්‍රිතාන්‍යයේ ක්‍රියාකලාපය ද වැදගත් වෙයි. බ්‍රිතාන්‍යයට ද අවශ්‍යවන්නේ ඒ පළාත් දෙක එකට තබාගෙන බලය බෙදීමට ය. එක් අතෙකින් ගත්කල බ්‍රිතාන්‍යය ඉන්දියාව ලවා තම සිතැඟි ඉටුකරගැනීමට වෙහෙස වෙයි. කෙසේ වෙතත් බ්‍රිතාන්‍යයට මෙන් ම ඉන්දියාවට ද උතුරු හා නැගෙනහිර පළාත් එක්කර බලය බෙදීමේ අවශ්‍යතාව වෙයි. මේ රටවල් දෙකට ම සිංහලයන් සමග තදබල වෛරයක් පවතින බව අමතක නොකළ යුතු ය. සිංහලයන්ට සියල්ල

© Prof. Nalin De Silva

ලැබුණේ එක්කෝ ඉන්දියාවෙන් ය, නැත්නම් එංගලන්තයෙන් (බ්‍රිතානියෙන්) ය යනුවෙන් සිතීමට පුරුදු වී ඇති දීන උගතුන් පිරිසක් මෙරට සිටින නමුත් ඔවුන්ගේ අවාසනාවකට සිංහලයන් විසින් නිර්මාණයකරන ලද අදීන සංස්කෘතියක් මෙරට වෙයි. ඒ නිසා ම සිංහලයෝ කිසි දිනෙක ඉන්දියාවට (භාරතයට) හෝ එංගලන්තයට හෝ යටත් නො වූහ. ඉන්දියාවට මෙතරම් අසළින් පිහිටි රටක් වන නමුදු භාරතයේ කිසිම රාජ්‍යයකට අපි මුළුමනින් යටත් නො වීමු. එමෙන් ම බ්‍රිතානියට හෝ වෙනත් යුරෝපීය රාජ්‍යයකට හෝ අපි මුළුමනින් යටත් නො වීමු. අප අවසානයේ දී ගිවිසුමක් මගින් බ්‍රිතානියට රට භාරදුන්නේ ඩොයිලිගේ සටකපටකම්වලින් මුළාවීම හේතුවෙන් මිස යුද්ධ ශක්තියෙන් හෝ කැපවීමෙන් හෝ හීන වූ නිසා නො වේ. කුඩා ජාතියක් වූ අප යටත්කරගැනීමට නොහැකිවීම පිළිබඳ ව බ්‍රිතානියට හා ඉන්දියාවට වී ඇති මදිපුංචිකම ගැන ඒ රටවල නායකයන් අපට කිසිදිනෙක සමාව නොදෙනු ඇත.

හමුදා ක්‍රියාමාර්ගයකින් කොටි සංවිධානය පරාජය කිරීමට අපට හැකි ය. ඒ සඳහා ඉන්දියාවේ හෝ එක්සත් ජාතීන්ගේ හෝ හමුදාවල සහාය අපට අවශ්‍ය නො වෙයි. ඒ බව දෙමළ පක්ෂ ද නොපිළිගන්නවා නො වෙයි. එහෙත් අද ඉන්දියාව ද, බ්‍රිතානිය ද, කොටින් ට විරුද්ධ එහෙත් ඔවුන්ගේ මරණ වරෙන්තුව යටතේ ක්‍රියාත්මක වන දෙමළ පක්ෂ ද මේ අවස්ථාවේ දී කොටි පැරදවීමට විරුද්ධ වෙයි. එයට ඇත්තේ එකම එක හේතුවක් පමණ ය. අද ඒ සියල්ලෝ ම තම අවශ්‍යතා ඉෂ්ටකර ගැනීම සඳහා කොටි නොපරදවා තබාගනිති. කොටින්ගෙන් කෙතරම් ප්‍රශ්න තිබුණ ද කොටි නොමැතිව තම ඉල්ලීම් දිනාගත නොහැකි යැයි ඔවුහු විශ්වාසකරති. ඔවුන්ට අද කොටි සංවිධානය යනු තම ඉල්ලීම් දිනාගැනීමේ දී කේවල්කිරීම සඳහා යොදාගතහැකි අවියකි. එබැවින් තම ඉල්ලීම් දිනාගන්නා තෙක් කොටි පැරදවීමට ඔවුන් ඉඩ නොදෙනු ඇත. එහෙත් ඔවුන් සෑහීමකට පත්වන විසඳුමක් දුන් විගස ඒ කිසිවකුවත් කොටි පැරදවීමට විරුද්ධ නොවනු ඇත.

අද කොටි නොවන දෙමළ පක්ෂවලට ද වඩා ප්‍රශ්නයක් වී ඇත්තේ ඉන්දියාව හා බ්‍රිතානිය ය. අනෙක් දෙමළ පක්ෂවලට ද වඩා එහා යන ඉල්ලීම් අද ඉදිරිපත්කරන්නේ ඒ රටවල් දෙක ය. ප්‍රශ්නය අද වන විට විකාශය වී ඇති ආකාරයට දෙමළ පක්ෂවලට ද ක්‍රියාකිරීමට සිදු වී ඇත්තේ ඉන්දියාවට අවශ්‍ය ආකාරයට යැයි සිතිය හැකි ය. ඉන්දියාව රාජ්‍ය සංකේතයක් ලෙස අශෝක චක්‍රය යොදාගෙන ඇති නමුත් පොදුවේ  ගත්කල බෞද්ධ විරෝධී ය. ඒ උඩින් නොපෙන්වන රාජ්‍ය තන්ත්‍රික කතා අස්සේ සඟවා ඇති එහෙත් යටින් දිවෙන විරෝධයකි. ඒ විරෝධය එන්නේ බ්‍රාහ්මණ වාංශිකයන් ඔස්සේ ය. බුදුන් වහන්සේගෙන් වඩාත්ම පහරකෑවෝ බමුණෝ ය. බමුණන්ට බුදු දහමත් සමග ඇති වෛරය තවමත් සන්සිඳී නැත. ඉන්දියාව පාලනයේ දී දේශපාලන වශයෙන් හා පරිපාලන වශයෙන් බ්‍රාහ්මණ වාංශිකයන් දරණ බලය ඉමහත් ය. භාරතයෙන් බුදුදහම තුරන්ව යද්දීත් ඒ රැකගත්තෝ ලංකාවේ සිංහලයෝ ය. බමුණන්ට සිංහලයන් සමග ගණුදෙනු රාශියක් බේරාගැනීමට ඇත.

දෙමළ ජාතිවාදී ප්‍රශ්නයේ මීළඟ අවස්ථාවේ අපේ සටන ඇත්තේ සෘජුව ම ඉන්දියාව සමගත් එපමණට සෘජුව නොවුණත් බ්‍රිතානිය සමඟත් ය. අපට මුහුණ පෑමට ඇති විශාලතම අභියෝගය එය ය. ඉන්දියාවේ දෙමළ ජනයාට වඩා ලංකාවේ දෙමළ ජනයාට අයිතිවාසිකම් හා වරප්‍රසාද ඇති බව මෙරට දෙමළ ජනයාට ද අමතක ය. ඉන්දියාවේ දෙමළ ජනයාට දිල්ලියේ ඇති පහසුකම්වලට වඩා ලංකාවේ දෙමළ ජනයාට කොළඹ ඇති පහසුකම් බෙහෙවින් වැඩි ය. දෙමළ මාධ්‍යයෙන් දෙමළ සිසුන්ට පමණක් ඉගැන්වෙන පාසල් කීයක් දිල්ලියේ ඇත් ද? දිල්ලියේ නාම පුවරු කීයක් දෙමළ බසින් වේ ද? දිල්ලි නගරයේ දෙමළ භාෂාව යොදාගැනීම සඳහා ඇති පහසුකම් කවරේ ද? ජවහර්ලාල් නේරු විශ්වවිද්‍යාලයේ හෝ උත්තර ප්‍රදේශයේ පිහිටි වෙනත් විශ්වවිද්‍යාලයක හෝ දෙමළ භාෂාවට ඇති තැන කුමක් ද? අද මෙරට දෙමළ ජනයාට ඇති වඩාත්ම ආරක්ෂාකාරී නගරය කොළඹ යැයි කීම අතිශයෝක්තියක් නො වේ. යාපනයට වඩා නිදහසේ දෙමළ ජනයාට අද කොළඹ ජීවත්විය හැකි ය. කොටි සංවිධානයේ හැරෙන්නට අනෙක් සියළු දේශපාලන පක්ෂවල නායකයන් ජීවත්වන්නේ කොළඹ ය. එසේ තිබිය දී ඉන්දියාවේ බ්‍රාහ්මණ වාංශිකයන්ට තම බෞද්ධ විරෝධී දේශපාලනය ඉදිරියට ගෙනයෑම සඳහා දෙමළ පක්ෂ යොදාගැනීමට හැකි වී තිබෙන්නේ කෙසේ දැයි අප විමසාබැලිය යුතු ය. අපට ඉන්දියාවේ බලපෑම්වලට හා බ්‍රිතානියේ දේශපාලන නූල් සූත්තරවලට හසු නොවී දෙමළ ප්‍රශ්නය විසඳන්නේ කෙසේ ද යන්නට මුහුණදීමට සිදු වී ඇත. ඉදිරි මාස කිහිපය මෙරට මෑතකාලීන දේශපාලනයේ තීරණාත්මක ම කාල පරිච්ඡේදය වනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva